# කාර්යසාධන වාර්තාව

# 2023

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය **: 243**

**අන්තර්ගතය**

## පරිච්ජේද

**01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය ........ 3**

1.1 හැඳින්වීම ........ 3

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු ........ 4

1.3 ප්‍රධාන කාර්යයන් ........ 4

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ ........ 7

1.5 දෙපාර්තමේන්තු අරමුදල ........ 7

1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) ........ 7

**02 පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම ........ 8**

2.1 පසුබිම ........ 8

2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය ........ 8

2.3 මුදල් ප්‍රදාන මගින් පොහොර සහනාධාරය ලබාදීම ........ 9

2.4 ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය සඳහා පුළුල් නියාමන රාමුවක් ස්ථාපිත කිරීම ........ 9

2.5 ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම ........ 9

2.6 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා දීම ........ 10

2.7 සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා වී මිලදී ගැනීම සඳහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ........ 10

2.8 ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක ඉන්දියානු ණය යෝජන ක්‍රමය ........ 11

2.9 සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය ........ 12

**03 පරිච්ඡේදය – 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය ........ 13**

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය ........ 13

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය ........ 14

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය ........ 15

3.4 මූල්‍ය ප්‍රකාශන සටහන් ........ 16

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය ........ 17

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝග ගැනීමේ කාර්ය සාධනය ........ 17

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන ............17

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය. ............18

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව ............19

**04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක ............25**

4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) ............25

**05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය* ............26**

5.1 හැදින්වීම ............26

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්යසාධනය (SDG) ............26

**06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ ............35**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය ............35

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිගය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න ............35

6.3 මානව සම්පත් සංවර්ධනය ............35

**07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව ............39**

# 01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 හැදින්වීම

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය (SME) අංශයෙන් දළ දේශීය නිෂ්පාදිතයට (GDP) සැලකිය යුතු දායකත්වයක් ලබා දීම සැලකිල්ලට ගනිමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා මූල්‍ය ප්‍රවේශ පහසුකම් සැලසීම සහ තාක්ෂණය ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම සඳහා පහසුකම් සැලසීම හා ශක්තිමත් කිරීම අරමුණු කර ගනිමින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව 2005 වසරේදී භාණ්ඩාගාර දෙපාර්තමේන්තුවක් ලෙස පිහිටුවන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය සඳහා සුදුසු ප්‍රතිපත්ති සහ උපාය මාර්ග සැකසීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යය විය. පසුව, රැකියා අවස්ථා උත්පාදනය කරමින් දිළිඳුකම පිටුදැකීමේ ගාමක බලවේගය වන ක්ෂුද්‍ර ව්‍යවසාය අංශය එකතු කරමින් ජාතික ප්‍රතිපත්තියට අනුකූලව දෙපාර්තමේන්තුවේ විෂය පථය පුළුල් කරන ලදී. ඒ අනුව, මූල්‍ය විසඳුම් සහ වෙළඳපල ප්‍රවේශය සහ සංවර්ධනය ලෙස මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන් කරුණු දෙකක් යටතේ වර්ගීකරණය කර ඇත.

### 1.1.1. මූල්‍ය විසඳුම්

අනෙකුත් නැගී එන ආර්ථිකයන් හා සමානව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ශ්‍රී ලංකා ආර්ථිකයේ ද ප්‍රධානතම අංශය වන අතර එය රටේ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 52කටත්, සේවා නියුක්තිය සඳහා සියයට 45කටත් අපනයනවලින් සියයට 20කටත් දායක වේ. එබැවින්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය පුළුල් කිරීම වත්මන් ආර්ථික අර්බුදයෙන් මිදීමට, අපනයන විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීමට, කලාපීය විෂමතා අවම කිරීමට සහ පසුගාමී ප්‍රජාවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වේ. කෙසේ වෙතත්, පසුගිය වසර කිහිපය තුළ සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරය, කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික පසුබෑම යන ත්‍රිත්ව බලපෑම් වලට මුහුණ දීමට ව්‍යාපාරවලට සිදු වූ බැවින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශය වඩාත් අවදානමට ලක් වූ අංශය බවට පත් වූ අතර එම ව්‍යවසායකයින් තවදුරටත් වෙළඳපොල තුල රැඳී සිටීමට සහ ඔවුන්ගේ ව්‍යාපාර තිරසාර ලෙස පවත්වාගෙන යාමට අරගලයක යෙදෙමින් සිටී. ඊට අමතරව, ක්ෂුද්‍ර මූල්‍යකරණය පුළුල් ලෙස පිළිගත් මූල්‍ය මෙවලමක් වන අතර එය අඩු ආදායම්ලාභීන්ට මූල්‍ය සේවා සැපයීමේදී වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ආර්ථික සංවර්ධනයට ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගීත්වය ලබා ගැනීමේදී ඔවුන්ගේ මූල්‍ය ප්‍රවේශය සඳහා ඇති හැකියාව වැඩි කර දරිද්‍රතා මට්ටම අඩු කිරීම ද සිදු කරනු ලබයි. නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සැලකිය යුතු ප්‍රමාණයක් ඇති බැවින්, අවදානමට ලක්විය හැකි අඩු ආදායම්ලාභීන් ණය උගුලට හසු වීම් වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාවේ නියාමනය නොකළ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන නියාමනය කිරීමට නීති සම්පාදනය කිරීම කාලීන අවශ්‍යතාවයකි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයට මූල්‍ය ප්‍රවේශ සඳහා පහසුකම් සැලසීම සහ ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ විෂයපථය යටතේ පවතින බැවින්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව ඊට අදාළ ප්‍රතිපත්ති හා උපාය මාර්ග සැකසීම මෙන්ම මූල්‍ය හා මූල්‍ය නොවන වැඩසටහන් ක්‍රියාවට නැංවීමේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එසේම, ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය කිරීම සඳහා අවශ්‍ය නියාමන යාන්ත්‍රණය බල ගැන්වීමෙන් අඩු ආදායම්ලාභී ප්‍රජාවන් මූල්‍ය සූරාකෑම් වලින් ආරක්ෂා කරමින් රටේ මූල්‍ය පද්ධතිය කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය ගොඩනැංවීමට අවශ්‍ය කටයුතු සිදුකිරීමද මෙම දෙපාර්තමේනතුව විසින් සිදු කරයි.

### 1.1.2. වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය

නිෂ්පාදකයින්ට සාධාරණ මිලක් සහතික කරන අතරතුර, වෙළඳපොළ මිල ස්ථාවර කිරීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන් සහ අනෙකුත් වෙළඳපොළ සාධක කෙරෙහි අවධානය යොමු කරමින් අතිරික්ත බෝග අස්වැන්න කළමනාකරණය කිරීම සහ ඉල්ලුම් සහ සැපයුම් අංශවල අසමානතා තුලනය කිරීම සඳහා ඉඩප්‍රස්ථා සකස් කිරීම ඉතා වැදගත් වේ. තවද, රට තුළ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමට කටයුතු

සම්පාදනය කිරීම අත්‍යවශ්‍ය වේ. එබැවින්, සහතික මිලට වී මිලදී ගැනීම, අඩු ආදායම්ලාභීන් සඳහා සහය ලබාදීම, සහනදායී ණය, භාණ්ඩාගාර ඇපකර, ගබඩා පහසුකම් සහ තාක්ෂණික සහාය යනාදී රජයේ දිරිගැන්වීම් ලබාදීම මෙම දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් සිදුකරණු ලැබේ. අඩු ආදායම්ලාභී ජනතාවට තම ජීවන තත්ත්වය පවත්වාගෙන යාමට සහයෝගය ලබා දෙන අතරතුර, ගොවීන් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දිරිමත් කිරීමත්, ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට දායකවීමට හැකියාව පවතින නව ව්‍යවසායකයින් බිහි කිරීමත් ඉහත දිරිගැන්වීම් මගින් සිදු කරණු ලබයි.

## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

### 1.2.1 දැක්ම

"සංවර්ධන මූල්‍ය සඳහා අවශ්‍ය පහසුකම් සපයන රජයේ ප්‍රමුඛ නියෝජිත ආයතනය බවට පත්වීම."

### 1.2.2 මෙහෙවර

"අදාළ පාර්ශවයන්ගේ මැදිහත්වීම ඇතිව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් යෙදවීම හා ප්‍රාථමික ව්‍යවසාය අංශය මූල්‍යනය හා ඊට අදාළ ප්‍රතිපත්ති හා ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම"

### 1.2.3 අරමුණ

"සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය හා ක්ෂුද්‍රමූල්‍ය අංශය නගා සිටුවීම"

## 1.3 ප්‍රධාන කාර්යයන්

1.3.1 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි සංවර්ධනය උදෙසා අවශ්‍ය ප්‍රතිපත්ති, ක්‍රමෝපායන් හා වැඩසටහන් සැකසීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.2 වෙළඳපොල දත්ත විශ්ලේෂණය කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන්හි දියුණුවට බලපාන ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම සහ ඒ සඳහා අවශ්‍ය ඵලදායී විසඳුම් ලබා දීම.

1.3.3 ආර්ථික සංවර්ධනය උදෙසා රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහනාධාර වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඊට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම.

1.3.4 වෙළඳපොල අවශ්‍යතාවයන් අනුව, බැංකු, රක්ෂණය, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සහ මූල්‍ය අංශයන්ට අදාළ නීති බලගැන්වීම සඳහා අවශ්‍ය සහසුකම් සැලසීම.

1.3.5 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, බැංකු, මූල්‍ය වෙළඳපොල සහ අනෙකුත් අංශයන්ට අදාළව රජයේ වාර්ෂික අයවැය සැකසීමේ ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම.


1.3.6 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය, ප්‍රාථමික ව්‍යවසාය අංශය සහ අනෙකුත් අංශයන්ට අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සහ විදේශ ණය ආධාර මත ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

1.3.7 ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය පිළිබඳව කෘෂිකාර්මික, කාර්මික, හා සේවා යන අංශ යටතේ දත්ත රැස් කිරීම හා ඒවා විශ්ලේෂණය කිරීම මඟින් පවතින දුෂ්කරතා හා ප්‍රතිපත්තිමය මැදිහත්වීම් හඳුනා ගැනීම.

1.3.8 රජයේ අනුග්‍රහය මත ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය සහන යෝජනා ක්‍රම පිළිබඳව සොයා බැලීම.

1.3.9 රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයන් හි සංවර්ධන ව්‍යාපෘති සඳහා දේශීය බැංකු හා මූල්‍ය පහසුකම් ලබා දීම.

# සංවිධාන සටහන


අධ්‍යක්ෂ ජනරාල්
විශේෂ ශ්‍රේණිය (විවෘත)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ ශ්‍රේණිය)
මූල්‍ය විසඳුම්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.කු.සේ. (විශේෂ ශ්‍රේණිය)
වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී.ලං.ප.සේ. (විශේෂ ශ්‍රේණිය)
පාලන
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. - I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.කු.සේ. - I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ග.සේ. - I
අධ්‍යක්ෂ ශ්‍රී.ලං.ප.සේ. - I පාලන
නි.අ./ස.අ. ශ්‍රී.ලං.ප.සේ. - II/III
නි.අ./ස.අ. ශ්‍රී.ලං.කු.සේ . - II/III
නි.අ./ස.අ. ශ්‍රී.ලං.ග.සේ. - II/III
නි.අ./ස.අ. ශ්‍රී.ලං.කු.සේ. - II/III
නි.අ./ස.අ. ශ්‍රී.ලං.ග.සේ. II/III මූල්‍ය
සං.නි.
තො.ස.කා.නි.
තො.ස.කා.ස.
ප්‍ර.ක.සේ.නි.
ක.සේ.නි. (4)
ක.ස.
කා.කා.ස. (6)
රියදුරු (6)
ක.සේ.නි. (1)
ක.සේ.නි. (5)

## 1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

1.4.1 මූල්‍ය විසඳුම්
1.4.2 වෙළඳපොළ ප්‍රවේශය සහ සංවර්ධනය
1.4.3 පරිපාලනය හා මූල්‍ය කළමනාකරණය

## 1.5 දෙපාර්තමේන්තු අරමුදල

අදාල නොවේ.

## 1.6 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

| ව්‍යාපෘතියේ නම | දායක නියෝජිතායතනය | ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත වියදම (රු. මිලියන) | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | ආසියානු සංවර්ධන බැංකුව | 69,623 | 2016-2024 |

## 02 පරිච්ඡේදය - ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

### 2.1 පසුබිම

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය රටේ සංවර්ධනයේ ප්‍රධාන යාන්ත්‍රණය වන බැවින්, ප්‍රශස්ථ මූල්‍ය විසඳුම් සහ සහයක යාන්ත්‍රණයන් ලබා දෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ සංවර්ධනය සහ තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීමේදී රජය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. සංවර්ධන හවුල්කරුවන්ගේ සහ දේශීය අරමුදල් උපයෝගී කර ගනිමින් සහනදායී ණය සහ ප්‍රදාන ලබා දීම වැනි ක්‍රියාමාර්ගයන් හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට මූල්‍ය ආධාර සැපයීමෙන් ඔවුන්ගේ මූල්‍ය ප්‍රවේශයන්ට ඇති හැකියාව ඉහළ නංවාලීමට අරමුණු කෙරේ. එපමණක් නොව, ජාතික ණය සුරැකුම් ආයතනය හරහා ක්‍රියාත්මක රජයේ අනුග්‍රහය සහිත ණය ඇපකර යෝජනා ක්‍රමය තුලින් ණය සඳහා ප්‍රවේශ වීමේදී ඇපකර ගැටළු හා අභියෝගවලට මුහුණ දෙන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ඇප අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරනු ලබයි. තවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් තාක්ෂණික හා මූල්‍ය සාක්ෂරතාවයෙන් සවිබල ගැන්වීම සඳහා කැපවූ නියෝජිතයින් සහ ආයතන හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සඳහා උපදේශන සේවා, තාක්ෂණික සහාය, පුහුණු වැඩසටහන් සහ සම්බන්ධීකරණ අවස්ථා සපයනු ලැබේ. තවද, අවිධිමත් මූල්‍ය උපකරණ යොදාගැනීමෙන් ඇතිවන මූල්‍ය සූරාකෑමෙන්, අවිධිමත් ව්‍යාපාර සහ අඩු ආදායම්ලාභී ප්‍රජාවන් සුරක්ෂිත කිරීමේ අරමුණින් ක්ෂුද්‍ර මූල්‍ය අංශය සඳහා අවශ්‍ය නියාමන යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරමින් පවතී.

### 2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමයේ ප්‍රගතිය

ආසියානු සංවර්ධන බැංකු අරමුදල් යටතේ ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය යටතේ ක්‍රියාත්මක සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය (SME Credit Line) මඟින් 2023 වර්ෂයේ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 917 ක් වෙත සහභාගීත්ව මූල්‍ය ආයතන 13 ක් හරහා ආයෝජන ණය වශයෙන් රු. මිලියන 8,895 ක් ලබාදෙන ලදී. විශේෂයෙන්ම, රු. මිලියන 429 ක් කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ප්‍රදානය ලෙස ආයෝජන ණය සමඟ සම්මිශ්‍රණය කරමින් කාන්තා ව්‍යවසායකයින් 420 දෙනෙකු වෙත ලබා දී ඇත. තවද, කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය (Tea Smallholder Credit Line) යටතේ කුඩා තේ වතු හිමියන් 1,520 දෙනෙකු වෙත ආසන්න වශයෙන් රු. මිලියන 2,406 ක් තේ නව වගාව, නැවත වගාව, පාළු සිටුවීම, ජල සම්පාදනය, පැළ තවාන් සංවර්ධනය හා යාන්ත්‍රීකරණය ආදී කටයුතු සඳහා ලබාදුන් අතර එයින් තේ නව වගාව හා නැවත වගාව ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් කුඩා තේ වතු හිමියන් 1,058 දෙනෙකු වෙත දිළිඳුකම අඩු කිරීම සඳහා වන ජපන් අරමුදල මගින් (Japan Fund for Poverty Reduction – JFPR රු. මිලියන 156 ක් වටිනා ප්‍රදාන ලබා දෙන ලදී. එසේම, 2023 වසර අවසන් වන විට ආර්ථික පසුබෑම හේතුවෙන් ව්‍යාපාරික කටයුතුවලට බලපෑම් එල්ල වී ඇති ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 895 දෙනෙකුට ඔවුන්ගේ ව්‍යාපාර නැවත නගාසිටුවීම සඳහා රුපියල් මිලියන 4,899 ක් පමණ වටිනා කාරක ප්‍රාග්ධන ණය ලබා දෙන ලදී.

ඉහත කරුණු වලට අමතරව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘතිය (Enhancing Small and Medium-sized Enterprises Finance Project) යටතේ ඇ.ඩො. මිලියන 100ක් ලබා දීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇති අතර, එයින් ඇ.ඩො මිලියන 50ක් පසුගිය වසර කීපය තුළ අඛණ්ඩව ආර්ථිකයට සිදු වූ හදිසි කම්පන මාලාව හේතුවෙන් පීඩාවට පත් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා තවදුරටත් ආධාර කිරීම සඳහා වෙන් කෙරේ. මෙම ව්‍යාපෘතිය සඳහා ණය ලබා ගැනීමට අදාල සාකච්ඡා 2023 වර්ෂයේදී පැවැත් වූ අතර ඒ අනුව, ශ්‍රී ලංකා රජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර ණය ගිවිසුම 2024 මාර්තු මාසයේදී අත්සන් කිරීමට නියමිතය.

## 2.3 මුදල් ප්‍රදාන මගින් පොහොර සහනාධාරය ලබාදීම

පවත්නා දුෂ්කර මූල්‍ය වටපිටාවක් තුල වුව ද, කෘෂිකාර්මික අංශයේ ශක්‍යතාවය සහතික කිරීම සඳහා, ගොවීන් වෙත පොහොර සහනාධාරය අඛණ්ඩව ලබා දීමට රජය පියවර ගෙන ඇත. පසුගිය සහනාධාර පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලියේදී හඳුනාගත්, පරිපාලන හා මෙහෙයුම් අකාර්යක්ෂමතා හේතුවෙන්, මූල්‍ය සහනාධාර ගොවීන් වෙත ලබාදීමට කටයුතු කරන ලදී. ඒ අනුව, කුඹුරු ඉඩම් වල වී වගාකරන ගොවීන් සඳහා හෙක්ටයාරයකට උපරිම වශයෙන් 2023 යල කන්නය සඳහා රුපියල් 20,000ක් වටිනා කූපන්පත් ද, 2023/24 මහ කන්නය සඳහා රු. 15,000ක මුදල් ප්‍රදානයන් ද ලබා දෙන ලද අතර එමගින් ගොවීන්ගේ කැමැත්ත පරිදි රසායනික පොහොර හෝ පරිසර හිතකාමී පොහොර හෝ අවශ්‍ය නම් එම දෙවර්ගයම වුව ද භාවිතා කල හැකි විය.

ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය සහයෝගය ඇතිව, 2022 වර්ෂයේදී ආනයනය කරන ලද, Muriate of Potash (MOP) පොහොර, වෙළඳපොල මිල හා සමාන්තර මිල අඩු කිරීමක් කර ගොවීන් වෙත සැපයීමට කටයුතු කරන ලද අතර, එමගින් ගොවීන් වෙත අඩු මුදලකට MOP පොහොර වෙළඳපොලෙන් සපයා ගැනීමේ හැකියාව තහවුරු කරන ලදී . කෙසේ වෙතත් අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා 2023 වර්ෂයේදී පොහොර සහනාධාරය ලබාදීම සම්බන්ධයෙන් සැලකිල්ලට ගෙන නොමැත.

## 2.4 ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය සඳහා පුළුල් නියාමන රාමුවක් ස්ථාපිත කිරීම

2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය සඳහා පුළුල් නියාමන රාමුවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් ක්ෂුද්‍ර මූල්‍ය කර්මාන්තය නියාමනය කිරීම සඳහා නව නීති රාමුවක් යෝජනා කරන ලදී. ඒ අනුව, නව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත 2023.10.09 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර 2023.10.30 දින ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත. අනතුරුව ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරී පනත් කෙටුම්පත අනුමැතිය සඳහා 2024 .01.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. විවිධ පාර්ශවයන් විසින් පනත් කෙටුම්පත අභියෝගයට ලක් කරන ලදී. ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය සැලකිල්ලට ගනිමින්, පාර්ශවකරුවන්ගේ ගැටලු ඇතුලත් වන පරිදි, පනත් කෙටුම්පත නැවත අධ්‍යනය කිරීම සඳහා කමිටුවක් පත් කරන ලදී.

## 2.5 ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම

කුකුළු ගොවිපල ආශ්‍රිත නිෂ්පාදකයන්ගේ එනම් කුකුල් මස් සහ බිත්තර නිෂ්පාදනයේදී නිෂ්පාදන පිරිවැයෙන් 80% කට ආසන්න ප්‍රමාණයක්, සත්ව ආහාර සඳහා වැය වන අතර එම සත්ව ආහාර අවශ්‍යතාවයෙන් 50%ක් පමණ බඩඉරිගු මගින් සපුරා ගනී. 2023 වර්ෂයේදී, දේශීය වෙළඳපොලේ බඩ ඉරිඟු නොපැවතීම සහ ආනයන සීමා කිරීම් හේතුවෙන් විශේෂයෙන් උත්සව සමයේදී කුකුළු මස් සහ බිත්තර මිල සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගියේය. වෙළඳපොලේ කුකුළු මස්, බිත්තර සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන සඳහා පාරිභෝගිකයාට දැරිය හැකි මිලක් සහතික කිරීම සඳහා, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිර්දේශය ඇතිව බඩඉරිඟු මෙට්‍රික් ටොන් 200,000ක් ආනයනය කිරීමට රජය අවසර දුන් අතර, බඩ ඉරිඟු කිලෝග්‍රෑමයකට රු.25ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් (SCL) පනවන ලදී. ඒ අනුව, 2023.12.31 දින වන විට බඩඉරිඟු මෙට්‍රික් ටොන් 187,000ක් ආනයනය කර ඇත.

## 2.6 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදා දීම

පසුගිය මහ කන්නයට සාපේක්ෂව 2022/2023 මහ කන්නයේ වී නිෂ්පාදනයේ සැලකිය යුතු ලෙස ඉහළ යාමක් පවතින බවට වාර්තා විය. ඒ අනුව, රටේ සාමාන්‍ය සහල් පරිභෝජනය මෙට්‍රික් ටොන් 210,000ක් පමණ වන බැවින්, 2022/2023 මහ කන්නයේ අපේක්ෂිත වී නිෂ්පාදනයේ යම් අතිරික්ත නිෂ්පාදනයක් පවතින බවට ඇස්තමේන්තු කරන ලදී. ඒ අනුව වී ගොවීන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් සහතික කිරීමට හැකිවන පරිදි යම් වී තොගයක් මිලදී ගැනීමට රජයේ මැදිහත්වීම අවශ්‍ය විය.

තවද, මීට පෙර ක්‍රියාත්මක වූ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන්වල ප්‍රධාන අරමුණුවලට අමතරව, රටේ පැවති අතිශය දුෂ්කර ආර්ථික තත්ත්වය හේතුවෙන් සමාජයේ අඩු ආදායම්ලාභී පිරිස් වෙත ඔවුන්ගේ පෝෂණ අවශ්‍යතා පවත්වාගෙන යාම සඳහා සහය ලබා දෙමින් අයහපත් බලපෑම්වලින් ඔවුන් ආරක්ෂා කර ගැනීමට අවධානය යොමු විය. සමෘද්ධි ප්‍රතිලාභීන්, ආබාධිත පුද්ගලයන්, වැඩිහිටියන් සහ නිදන්ගත වකුගඩු රෝගීන් යන කාණ්ඩ හතරකට අයත් අඩු ආදායම්ලාභී කණ්ඩායම් සඳහා රජය විසින් අතිරේක මුදල් ප්‍රදානයක් ලබා දුන්නද, යම් කාල සීමාවක් සඳහා මෙම කණ්ඩායම් තවදුරටත් රැකබලා ගැනීමට අවශ්‍ය විය.

ඒ අනුව, හඳුනාගත් අඩු ආදායම්ලාභී පවුල් සඳහා මාස 2ක කාලයක් සඳහා උපකාර කිරීමේ අරමුණ ඇතිව, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් වී මිලදී ගැනීමේ වැඩ සටහන සහ හඳුනාගත් අඩු ආදායම් ලාභී පවුල් වෙත සහල් බෙදාදීමේ වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන යටතේ, කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් 454ක් හරහා 2023 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දිස්ත්‍රික්ක 20ක වී මෙට්‍රික් ටොන් 100,895ක ප්‍රමාණයක් මිලදී ගැනීමට කටයුතු කරන ලද අතර එමගින් එක් පවුලක් සඳහා කිලෝග්‍රෑම් 20 බැගින් වන සේ දිස්ත්‍රික්ක 25හි අඩු ආදායම්ලාභී පවුල් 2,739,505ක් සඳහා සහල් මෙට්‍රික් ටොන් 54,974ක් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන සඳහා වැය කර ඇති මුළු මුදල රුපියල් මිලියන 11,750ක් පමණ වේ. අඩු ආදායම්ලාභී ජනතාවට සහල් බෙදාහැරීම අවසන් කිරීමෙන් පසු වෙළෙඳපොළේ සහල් තොග පැවතීම ඉහළ නැංවීම සඳහා ඉතිරි සහල් තොග වෙළෙඳපොළට ලබාදීමට ද කටයුතු කරන ලදී.

## 2.7 සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා වී මිලදී ගැනීම සඳහා ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම

මෑත වසරවල ලද අත්දැකීම් අනුව, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් ගොවීන්ගේ වී අස්වැන්න සඳහා සාධාරණ මිලක් ලබා දෙමින්, රටේ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා අනගි කාර්යභාරයක් ඉටු කර ඇත. කෙසේ වුවද, වෙළඳපොල තුල පැවති ඉහළ පොලී අනුපාත හේතුවෙන් මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීම අඩු මට්ටමක පැවතීම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් අඛණ්ඩව මුහුණ දෙන ප්‍රධාන අභියෝගයක් ලෙස හඳුනාගෙන තිබුණි. එබැවින්, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට 2023 යල කන්නය සඳහා වී මිලදී ගැනීමට හැකි වන පරිදි රාජ්‍ය බැංකු හරහා සහන පොලී අනුපාත යටතේ ඔඩපණ ණය යෝජනාක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට රජය තීරණය කරන ලදී. මෙම වැඩපිළිවෙල මගින් මෙම කන්නයේ වී මිලදී ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදෙමින් වී මෝල්හිමියන් ශක්තිමත් කිරීමටත් ගොවීන් සඳහා සාධාරණ මිලක් පවත්වා ගැනීමටත් රජය අපේක්ෂා කරන ලදී.

මහජන බැංකුව සහ ලංකා බැංකුව මගින් ලබා දුන් ඔඩපණ ණය පහසුකම්වල වටිනාකම පිළිවෙලින් රුපියල් මිලියන 151.5ක් සහ රුපියල් මිලියන 433.5ක් පමණ වේ. ඒ අනුව, 2023 යල කන්නයේ සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට රුපියල් මිලියන 585ක් වටිනා ඔඩපණ ණය මුදල් ප්‍රදානය කර ඇත.

තවද, ඔඩපණ ණය යෝජනා ක්‍රමය යටතේ, වාර්ෂිකව ගෙවනු ලබන සියයට 16ක සඵලදායී පොලී අනුපාතයෙන් සියයට 4ක වාර්ෂික පොලී අනුපාතයක් අදාළ බැංකුවලට පොලී සහනාධාරයක් ලෙස මහා භාණ්ඩාගාරයෙන් ගෙවන ලදී. ඒ අනුව, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් විසින් ගෙවනු ලැබුවේ වසරකට සියයට 12ක පොලී අනුපාතයක් පමණි. මෙම ණය යෝජනාක්‍රමය යටතේ 2023 වසර තුළ මහජන බැංකුවට සහ ලංකා බැංකුවට ගෙවා ඇති මුළු පොලී සහනාධාර මුදල පිළිවෙලින් රුපියල් 115,546.56ක් සහ රුපියල් 1,009,326.04ක් වේ.

## 2.8 ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක ඉන්දියානු ණය යෝජන ක්‍රමය

බැංකු පද්ධතියේ හා වෙළඳපොළ තුළ පැවැති විදේශ විනිමය හිඟතාවය නිසා ණයවර ලිපි විවෘත කිරීමේදී දුෂ්කරතා රැසකට මුහුණ දීමට සිදුවූ ශ්‍රී ලංකාවේ ආනයනකරුවන්ට පහසුකම් සැලසීමේ අරමුණින් 2022 මාර්තු 05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලද අනුමැතිය අනුව 2023 මාර්තු 16 දක්වා ඉන්දියාවෙන් අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය කිරීම සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක ණය මුදලක් ලබා ගැනීමට 2022 මාර්තු 17 දින ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රාජ්‍ය බැංකුව අතර ණය පහසුකම් ගිවිසුමක් අත්සන් කරන ලදි. එවකට පැවැති ආර්ථික අර්බුදය අනුව රටේ ආර්ථිකය නගා සිටුවීමට ඉවහල් වන සාධක විශ්ලේෂණය කරමින් ආරම්භයේදී කාර්මික අමුද්‍රව්‍ය, අත්‍යවශ්‍ය භාණ්ඩ සහ ඖෂධ යන අංශ තුන අතර ණයමුදල් වෙන් කළ අතර පසුව රට තුළ ඇති වූ ඉන්ධන හිඟය සළකා බලා 2022 මැයි මස මැද භාගයේ දී ඉන්ධන ආනයනය කිරීමට ඩොලර් මිලියන 200ක් වෙන් කරන ලදී.

ඒ වනවිට පැවති උපයෝජනය නොකළ ණය මුදල් ප්‍රමාණය සහ ඖෂධ ආනයනය කිරීමේ අවශ්‍යතාවය සලකා බලා ඉතිරි ණය මුදල භාවිතා කිරීමේ කාලසීමාව 2024 මාර්තු 16 දක්වා දීර්ඝ කිරීම සඳහා ඉන්දියානු රාජ්‍ය බැංකුව එකඟවූ අතර 2023 ජුනි මස 07 වන දින ණය කාලසීමාව දීර්ඝ කිරීමේ ගිවිසුම් අත්සන් කරන ලදි. උපයෝජිත අරමුදල් ප්‍රමාණය අවලංගු කළ සහ ප්‍රතික්ෂේප කළ ප්‍රමාණය සහ එක් එක් අංශයට තවදුරටත් අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අත්‍යවශ්‍ය භාණ්ඩ සඳහා රු. මිලියන 100ක්, ඖෂධ සඳහා රු. මිලියන 360ක්, කාර්මික අමුද්‍රව්‍ය සඳහා රු. මිලියන 70ක් සහ ඉන්ධන සඳහා රු. මිලියන 200 වශයෙන් එක් එක් අංශයේ ණය ප්‍රතිපාදන ප්‍රමාණය සංශෝධනය කරන ලද අතර එක් එක් අංශයේ අනාගත අවශ්‍යතා සඳහා භාවිතා කිරීමට හැකිවන පරිදි රු. මිලියන 270ක් වෙන් කරන ලදි.

ඒ අනුව, 2023 දෙසැම්බර් 31 දින වන විට, ණය පහසුකම උපයෝගී කරගනිමින් ඩොලර් මිලියන 450ක් වටිනා භාණ්ඩ රට තුළට ආනයනය කර තිබූ අතර ඉන් ඩොලර් මිලියන 434ක් වෙනුවෙන් අපනයනකරුවන්ට ගෙවීම් සිදුකිරීම සඳහා අවශ්‍ය ගෙවීම් නිර්දේශ නිකුත් කර තිබුණි. ඉන්ධන, නිමි ඖෂධ සහ ඖෂධ නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා ප්‍රධාන වශයෙන් මෙම ණය පහසුකම භාවිතා කරනු ලැබූ අතර 2023 දෙසැම්බර් 31 දිනට එක් එක් අංශයේ ප්‍රගතියේ සාරාංශය පහත පරිදි වේ.

2023 දෙසැම්බර් 31 දිනට සාරාංශය

(ඇ. ඩො. මි.)

| කාණ්ඩය | වෙන්කළ ප්‍රමාණය | ඉන්දියානු මහකොමසාරිස් කාර්යාලයට යොමු කළ ප්‍රමාණය | ප්‍රතික්ෂේපිත /අවලංගු කළ ප්‍රමාණය | අනුමත ප්‍රමාණය | ආනයනය කරන ලද ප්‍රමාණය | නිකුත්කළ ගෙවීම් නිර්දේශ ප්‍රමාණය | නිකුත්කළ ගෙවීම් නිර්දේශ වල ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| කාර්මික අමුද්‍රව්‍ය | 70 | 136 | 62 | 49 | 44 | 43 | 99.0 |
| ඖෂධ | 360 | 228 | 34 | 180 | 128 | 113 | 88.0 |
| අත්‍යාවශ්‍ය භාණ්ඩ | 100 | 298 | 150 | 91 | 78 | 78 | 99.9 |
| ඉන්ධන | 200 | 200 | | 200 | 200 | 200 | 100.0 |
| එල් පී ගෑස් | | 17 | | - | | | |
| වෙන් නොකළ | 270 | | | | | | |
| **එකතුව** | **1,000** | **879** | **246** | **520** | **450** | **434** | **96.8** |

*මූලාශ්‍රය: ඉන්දියානු ණය පහසුකම් සම්බන්ධීකරණ ඒකකය*

## 2.9 සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය

සීඝ්‍රයෙන් වෙනස්වන වෙළඳපොළ ඉල්ලුමට හා තාක්ෂණික වෙනස්වීම් වලට අනුවර්තනය වීමට ඇති නොහැකියාව, අඩු මූල්‍ය පහසුකම් හේතුවෙන් ඇතිවන ධාරිතාමය ගැටළු, සීමා සහිත මූල්‍ය ප්‍රවේශය සහ විශේෂයෙන් පිළිගත හැකි ඇප ලබා දීමට ඇති නොහැකියාව වැනි ගැටළු මගහරවා ගැනීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට සහය වීමේ අරමුණින් ලියාපදිංචි අංක පී බී 00271461 යටතේ පොදු සීමිත සමාගමක් ලෙස සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනය පිහිටුවන ලදි. මෙම සමාගමේ මූලික කොටස් හිමියන් ලෙස ශ්‍රී ලංකා රජය සහ සහභාගීත්ව මූල්‍ය ආයතන දහතුනක් (බලපත්‍රලාභී බැංකු දහයක් සහ බලපත්‍රලාභී බැංකු නොවන මූල්‍ය ආයතන තුනක් ) තෝරාගෙන ඇත. සමාගමේ සම්පූර්ණ අධ්‍යක්ෂ මණ්ඩලය නම් කර ඇති අතර, ශ්‍රී ලංකා රජය සහ සහභාගීත්ව මූල්‍ය ආයතන අතර කොටස් හිමියන්ගේ ගිවිසුම අත්සන් කර තිබේ. ආසියානු සංවර්ධන බැංකුව විසින් සීමාසහිත ජාතික ණය සුරැකුම් ආයතනයේ මූලික ප්‍රාග්ධනය ලෙස යෙදවීම සඳහා ශ්‍රී ලංකා රජයට ඩොලර් මිලියන 50ක ණය මුදලක් ලබා දේ. මෙම රාජ්‍ය පෞද්ගලික සහභාගීත්ව ආකෘතිය ආයතනයේ තිරසාර බව සහතික කරනු ඇත. ආයතනයේ කාර්යසාධනය දර්ශකයන් ලඟාකරගැනීමට අනුව රජයේ මීලඟ ප්‍රාග්ධන මුදල් දායකත්වය ලෙස යෙදවීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව විසින් 2026 වර්ෂයේදී ශ්‍රී ලංකා රජය වෙත ඇමරිකානු ඩොලර් මිලියන 50ක අතිරේක ණය මුදලක් ලබා දෙනු ඇත. මේ යටතේ ණය සුරැකුම් නිකුත් කිරීම 2024 වර්ෂයේ තුන්වන කාර්තුවේදී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

**අ/කලේ**
**මලර්මදි ගංගාදරන්**
**අධ්‍යක්ෂ ජනරාල්**

## 03 පරිච්ඡේදය - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023 රු. | | සටහන | තථ්‍ය 2023 රු. | තථ්‍ය 2022 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | මුළු ආදායම් ලැබීම් (අ) | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 19,532,080,946 | 20,277,341,570 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 35,935,400,141 | 52,476,765,810 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 3,537,761 | 3,007,786 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | 55,471,018,847 | 72,757,115,166 | |
| - | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | 55,471,018,847 | 72,757,115,166 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) | | 35,935,236,311 | 52,476,626,035 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | 19,535,782,536 | 20,280,489,131 | |
| | අඩු කළා : වියදම් | | | | |
| - | පුනරාවර්තන වියදම් | | - | - | |
| 54,900,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 50,306,065 | 48,003,735 | ඒසීඒ-2(ii) |
| 20,060,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 13,680,219 | 12,344,889 | |
| 21,366,330,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 20,225,487,607 | 20,272,915,111 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| **21,441,290,000** | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | **20,289,473,890** | **20,333,263,734** | |
| | මූලධන වියදම් | | | | |
| 600,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 10 | 324,050 | 267,000 | ඒසීඒ-2(ii) |
| 10,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම | 11 | 628,730 | 2,361,040 | |
| 2,220,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,836,221,742 | 942,626,347 | |
| 63,802,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 11,051,791,115 | 11,354,796,347 | |
| 300,000 | හැකියා වර්ධනය | 14 | 242,050 | 81,926 | |
| 9,300,000 | වෙනත් මූලධන වියදම් | 15 | 943,105 | 6,559,086 | |
| **66,042,200,000** | මුළු මූලධන වියදම් (උ) | | **12,890,150,791** | **12,306,691,746** | |
| | තැන්පතු ගෙවීම් | | 46,956,502,599 | 36,218,057,375 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 3,193,725 | 2,238,788 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | **46,959,696,323** | **36,220,296,163** | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | **80,139,321,005** | **68,860,251,643** | |
| - | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | **(60,603,538,469)** | **(48,579,762,512)** | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | (60,603,538,469) | (48,579,762,512) | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | (60,603,538,469) | (48,579,762,512) | ඒසීඒ-3 |

1

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | 2,023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 1,765,928,144 | 1,715,350,080 |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 6,544,343 | 6,888,379 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | - |
| **මුළු වත්කම්** | | 1,772,472,487 | 1,722,238,459 |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (5,231,384,516) | (16,252,142,938) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 1,765,928,144 | 1,715,350,080 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 5,237,928,859 | 16,259,031,317 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | - |
| **මුළු වගකීම්** | | 1,772,472,487 | 1,722,238,459 |

පිටු අංක 06 සිට 31 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 32 සිට 33 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරි | ගණන්දීමේ නිලධාරි | ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම :කේ.එම්.එම්.සිරිවර්ධන | නම :මලර්මදි ගංගාදරන් | නම :ඩබ්ලිව්.පී.බී.එස් අබේවර්ධන |
| තනතුර :ලේකම්,මුදල්,ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | තනතුර :අධ්‍යක්ෂ ජනරාල් | |
| දිනය : | දිනය : | දිනය : |

2

## 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

**2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | සටහන | 2023 රු. | 2022 රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | - | - |
| මුළු බදු ලැබීම් | | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | | - | - |
| ලාභ | | - | - |
| ආදායම් නොවන ලැබීම් | | 2,958,041 | 6,440,483 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | | 19,532,080,946 | 20,277,341,570 |
| අග්‍රිම ලැබීම් | | 2,648,302 | 2,400,749 |
| අත්තිකාරම් අයකර ගැනීම් | | 35,935,400,141 | 52,476,765,810 |
| තැන්පතු ලැබීම් | | 55,473,087,430 | 72,762,948,612 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | | | |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | 63,531,684 | 60,815,750 |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | | 19,161,323,008 | 20,215,046,597 |
| සහනාධාර සහ මාරුකිරීම් | | | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | | 35,935,236,311 | 52,476,626,035 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | | 1,707,136 | 2,028,668 |
| අත්තිකාරම් ගෙවීම් | | 251,525,618 | 348,807 |
| තැන්පතු ගෙවීම් | | 55,413,323,757 | 72,754,865,857 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | | 59,763,673 | 8,082,755 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| පොලී | | - | - |
| ලාභාංශ | | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | | - | - |
| උපකරණය අයකර ගැනීම් | | - | - |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| මූලධන වියදම් | | 59,763,673 | 8,082,755 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | | 59,763,673 | 8,082,755 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | | (59,763,673) | (8,082,755) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේශීය ණය ගැනීම් | | - | - |
| විදේශීය ණය ගැනීම් | | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | | - | - |

3

### 3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

#### 3.4.1 වාර්තා කිරීමේ පදනම

**i. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**ii. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩි දියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩි දියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**iii. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**iv. දේපල, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා ගැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්ම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවල දී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**v. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

**vi. මුදල් හා මුදල් සමාන දෑ**

2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය.

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| අදාළ නොවේ | | | | | |

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝග ගැනීමේ කාර්ය සාධනය.

රු.

| ප්‍රතිපාදන වර්ග | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 21,441,290,000 | 21,441,290,000 | 20,289,473,890 | 95 |
| ප්‍රාග්ධන | 66,042,200,000 | 66,042,200,000 | 12,890,150,791 | 20 |

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. 000

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල %ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| | අදාළ නොවේ | | | | | |

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය.

රු.

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය ්‍ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 5,059,600 | 5,059,600 | --- | --- |
| 9152 | යන්ත්‍රෝපකරණ | 91,389,331 | 91,389,331 | --- | --- |
| 9153 | ඉඩම් | --- | --- | --- | --- |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | --- | --- | --- | --- |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | --- | --- | --- | --- |
| 9160 | කෙරීගෙන යන වැඩ | 1,669,479,213 | 1,669,479,213 | --- | --- |
| 9180 | බදු දෙන ලද වත්කම් | --- | --- | ---- | --- |

## 3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/E/DDF/2/23/01

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2024 මැයි 28 දින

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව මහලේකම් කාර්යාලය, කොළඹ - 01
28 MAY 2024
Department of Development Finance Secretariat, Colombo - 01.

ගණන්දීමේ නිලධාරී

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව

**ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය - 243 සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) වැය විෂයයන් 10 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.6,789,112,090 ක ප්‍රමාණයක් සියයට 2 සිට සියයට 257 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම මඟින් වැඩි කරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් 14 ක් සඳහා වූ මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවීම හේතුවෙන් එකතුව රු.6,874,992,990 ක් හෙවත් මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 3 සිට සියයට 51 දක්වා වූ පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම මඟින් ප්‍රතිපාදන අඩු කර තිබුණි.

(ඇ) වැය විෂයය අංක 243-1-1-45-1501-11 අඩු ආදායම්ලාභී ජනතාව සඳහා ආහාර සුරක්ෂිතතා වැඩසටහන සහ වැය විෂයය අංක 243-1-1-51-1504-11 යල කන්නය සඳහා රාජ්‍ය බැංකු මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන් සඳහා ඔඩපණ ණය ලබා දීමට අදාල පොලී සහනාධාර රාජ්‍ය බැංකු වෙත ගෙවීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදී මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සලසා නොගෙන මුදල් රෙගුලාසි 66 මාරු කිරීම මඟින් රු.84,756,000 කින් ප්‍රතිපාදන සලසාගෙන තිබුණි.

(ඈ) භාණ්ඩාගාර ලේකම්ගේ 2023 ජනවාරි 27 දිනැති අංක 01/2023 දරන අයවැය චක්‍රලේඛයේ 02 (අ) ඡේද යටතේ දක්වා ඇති වැය විෂයයන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනය හැර අනෙකුත් සියලුම පුනරාවර්තන වියදම් සඳහා වූ ප්‍රතිපාදනවල එකතුවෙන් සියයට 06 කට සමාන ප්‍රතිපාදන ප්‍රමාණයක් අවම වශයෙන් කපා හැරීම සිදු කළ යුතු වුවත්, කපා හැර තිබුණේ සියයට 5.38 ක ප්‍රමාණයක් බව නිරීක්ෂණය විය.

(ඉ) වැය විෂයයන් 05 ක් සම්බන්ධයෙන් 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු. 50,168,500,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනයෙන් තොරව ඉතිරි වී තිබුණි.

4

(ඊ) සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 13 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.1,666,861,200 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.1,089,437,365 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 50 සිට සියයට 99 ක සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 14:11 වගන්තියට අනුව 23 වැනි පරිශිෂ්ටයේ දක්වා ඇති පරිදි ආපදා ණය ලබා දීමේදී විශ්‍රාම වැටුප පරිවර්තනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කළ නොහැකි පොරොන්දු ප්‍රකාශයක් ලබා ගත යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් 19 දෙනෙකු සඳහා ආපදා ණය රු.1,469,440 ක් ගෙවීම කිරීමේදී ඉහත ප්‍රකාශය ලබාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්යසාධනය

### 3.1.1 මූල්‍ය සහන ණය යෝජනා ක්‍රියාත්මක කිරීම

(අ) දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම මත ක්‍රියාත්මක වූ එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා ණය යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය සහන ණය යෝජනා ක්‍රම 15 ට අදාළ මූල්‍ය ආයතන සඳහා 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවෙන් ගෙවිය යුතු හිඟ පොළිය එකතුව රු.666,753,396 ක් බව නිරීක්ෂණය විය. තවද 2023 දෙසැම්බර් 31 දිනට අදාළ මූල්‍ය ආයතන වෙතින් එම ගෙවීමට ඇති පොළිය පිළිබඳ ශේෂ සනාථ කර ගැනීමක් සිදු කර නොතිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ තැන්පතු සඳහා වන ණය යෝජනා ක්‍රමය යටතේ තැන්පත්කරුවන් විසින් අනුමත මූල්‍ය ආයතනවල තැම්පත්කොට ඇති තැන්පතු වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ආයතන 17 ක් වෙත දෙපාර්තමේන්තු විසින් ගෙවිය යුතු හිඟ ණය පොළිය රු.108,708,315,853 ක් විය.

(ඇ) ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර ක්‍රමය යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රම (SMELoC) ව්‍යාපෘතිය සඳහා අනුමත මූල්‍ය ආයතන වෙත ලබා දී 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු උප ණය මුදල රු.57,655,546,322 ක් වූ අතර මෙම යෝජනා ක්‍රමය යටතේ රු.2,214,490,586 ක් ප්‍රදාන ලෙස ලබා දී ඇති බව ද නිරීක්ෂණය විය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණය කෙරේ.

රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්තිත්ව මිල සැඳහුම් ක්‍රමයට ප්‍රසම්පාදන කිරීමේදී විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතා කළ යුතු බව දක්වා තිබුණද දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේ අවස්ථා 06 දී එකතුව රු.1,584,599 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් මිල සැදැහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි.

## 4. මානව සම්පත් කළමනාකරණය

### 4.1 අනුයුක්ත හා තත්‍ය කාර්යමණ්ඩලය

දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 59 න් තනතුරු 10 ක් පුරප්පාඩුව පැවතුණි. ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් ද ද්විතීයික මට්ටමේ තනතුරු 02 ක් ද ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් ද විය.

බී.ඕ.ඩී. ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

## 04 පරිච්ඡේදය - කාර්ය සාධක දර්ශක

### 4.1 ආයතනයේ කාර්ය සාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).

| විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|
| | 100% - 90% | 75%- 89% | 50%- 74% |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය | | 84% | --- |
| කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ක්‍රමය | --- | 84% | --- |
| කුඩා තේ වතු හිමියන්ගේ ණය යෝජනා ක්‍රමය | --- | 78% | --- |
| කුඩා තේ වතු හිමියන් සඳහා ජේ එෆ් පී ආර් ප්‍රදාන සංරචකය | --- | 84% | --- |
| සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය හදිසි ප්‍රතිචාර සංරචකය | 100% | --- | --- |
| සුළු හා මධ්‍ය පරිමාණයේ වී මෝල්කරුවන් හරහා වී මිලදී ගැනීම | 100% | --- | --- |
| අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහල් බෙදාදීම | 100% | --- | --- |

## 05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය*

### 5.1 හැඳින්වීම

තිරසාර සංවර්ධනයේ මූලික පරමාර්ථය වන්නේ ජාතියක ස්වභාවික සම්පත් වර්තමානයේ ඵලදායී ලෙස කළමනාකරණය කරමින් අනාගත පරපුර සඳහා සංරක්ෂණය කිරීමයි. මේ අනුව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන 2015 දී එළිදක්වන ලද තිරසාර සංවර්ධන ඉලක්ක (SDG) 17, 2030 වන විට සාමාජික රටවල් 193ක් විසින් ඉටු කිරීමට නියමිත අතර ක්ෂේත්‍ර 17ක් පුරා විහිදේ. එබැවින්, මානව, සමාජීය, ආර්ථික සහ පාරිසරික අංගවල මූලික කුළුණු එකිනෙක සම්බන්ධ කිරීමෙන්, පාරිසරික තිරසාරත්වය, සමාජ තිරසාරභාවය සහ ආර්ථික සංවර්ධනය තුළින් තිරසාර සංවර්ධනයක් කරා ආර්ථිකයන් මෙහෙයවීම මෙහි ඉලක්කය වේ. රාජ්‍ය අංශය, රාජ්‍ය නොවන සංවිධාන සහ ජාත්‍යන්තර සංවිධාන සමඟ එක්ව, වසර 2030 වන විට තිරසාර සංවර්ධනයේ අභිමතාර්ථ සහ ඉලක්ක සපුරාලීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගනිමින් සිටී.

ඵලදායිතාව ඉහළ නැංවීම සඳහා ආයෝජන කඩිනම් කිරීම, ප්‍රමුඛතා අංශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් සංවර්ධන උපාය මාර්ග මෙහෙයවීම SDG හි ප්‍රමුඛතම හා පළමු ඉලක්කය වන "සියලු ආකාරයේ දිළිඳු බව සියලු තැන්හිම දුරුකිරීම" යන ඉලක්කය සපුරා ගැනීම සඳහා අවශ්‍ය වේ." ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේ තීරණාත්මක උපායමාර්ගික අංශයක් ලෙස කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වැදගත්කම අවබෝධ කර ගනිමින් සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව ඒ සඳහා රජයේ දායකත්වය ලබා දීම සඳහා ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම ව්‍යවසාය අංශයේ වැඩසටහන් කිහිපයක් දියත් කර ඇත. ඒවා අතරින් ආර්ථික පසුබෑමෙන් පීඩාවට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ක්‍රියාත්මක කරන ලද කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය (SMELoC) ප්‍රමුඛ ස්ථානයක් ගනියි.

### 5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ කාර්යසාධනය (SDG)

#### 5.2.1 හඳුනාගත් තිරසාර සංවර්ධන ඉලක්ක

| ඉලක්කය/අරමුණ | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%- 49% | 50%- 74% | 75% -100% |
| අරමුණ 02<br><br>කුසගින්න නිමා කිරීම, ආහාර සුරක්ෂිතතාව ලඟාකරගැනීම සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | 2.4 2030 වන විට, තිරසාර ආහාර නිෂ්පාදන පද්ධති සහතික කිරීම සහ තිරසරබව සහ නිෂ්පාදනය වැඩි කරන,<br><br>පරිසර පද්ධති පවත්වා ගැනීමට උපකාරී වන, දේශගුණික විපර්යාසවලට අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන,<br><br>ආන්තික කාලගුණය, නියගය, ගංවතුර සහ වෙනත් ආපදාවලට අනුවර්තනය වීමේ හැකියාව ශක්තිමත් කරන සහ ක්‍රමානුකූලව ගොඩබිම සහ පස | 2.4.1 ඵලදායී හා තිරසාර කෘෂිකර්මය යටතේ වන කෘෂිකාර්මික සමානුපාතිකය. | **නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව: 51,558<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර මුදල : රු. මිලියන 545<br><br>**"රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 7,970<br><br>ණය මුදල : රු. මිලියන 11,469.3<br><br>2023 වසරේ පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 307.8<br><br>**"ගොවි නවෝදා" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 1451 | | |

| | | | |
|---|---|---|---|
| | වැඩිදියුණු කරන හා ඔරොත්තු දෙන කෘෂිකාර්මික පිළිවෙත් ක්‍රියාත්මක කිරීම. | | ණය මුදල : රු. මිලියන - 682.4<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 38.3<br><br>**හෙක්ටයාර දෙකකට අඩු වී ගොවීන් ලබාගෙන ඇති අක්‍රීය ණය කපා හැරීම**<br><br>කපා හරින ලද ණය ගණනः 27,840<br><br>සම්පූර්ණ කපා හරින ලද ණය මුදලः රු. මිලියන 631.51<br><br>2023 වසරේ කපා හරින ලද ණය මුදල රු. මිලියන 281.51 කි<br><br>**ගබඩා ඉදිකිරීම**<br><br>අස්වැන්න නෙලන කාලය තුල ධාන්‍ය වල මිල පහළ යන බැවින් අස්වැන්න නොමැති කාලයේ ධාන්‍ය සඳහා ඉහළ මිලක් ලබා ගැනීම අරමුණු කරගනිමින් වී, බඩ ඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස්, රටකජු හා අනෙකුත් භෝග ගබඩා කිරීම සඳහා අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චිය සහ පොළොන්නරුව යන ප්‍රදේශවල දළ වශයෙන් මෙට්‍රික් ටොන් 17,200ක ඒකාබද්ධ ගබඩා ධාරිතාවක් සහිත ගබඩා පහක් ඉදිකරන ලදී. 2023 වර්ෂය තුලදී ගබඩා කර ඇති මුළු ධාන්‍ය ප්‍රමාණය මෙට්‍රික් ටොන් 3,874කි.<br><br>සූර්ය බලශක්තිය නිෂ්පාදනයෙන් ලැබෙන ආදායම ඇතුළුව ගබඩා පහසුකම් සැපයීමෙන් උපයන ලද රාජ්‍ය ආදායම රුපියල් මිලියන 25කි.<br><br>ගබඩා කුවිතාන්සි මූල්‍යකරණ වැඩසටහන යටතේ සහනදායී ණය ලබා ගත් මුළු ගොවීන් සංඛ්‍යාව සහ මුළු ණය මුදල පිළිවෙලින් 374ක් සහ රුපියල් මිලියන 151කි.<br><br>**රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන**<br><br>සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික්ක 25 ක දිසාපතිවරුන් විසින් මිලදී ගත් වී ප්‍රමාණය - මෙට්‍රික් ටොන් 100,895ක් පමණ වේ ( ප්‍රගතිය - 100%කි). |

| | | | |
|---|---|---|---|
| | | | බෙදා හරින ලද සහල් ප්‍රමාණය - අඩු ආදායම්ලාභී පවුල් මිලියන 2.74ක් සඳහා මෙට්‍රික් ටොන් 54,974කි (ප්‍රගතිය - 100%කි).<br><br>වෙළඳපොළට සපයන ලද ඉතිරි සහල් ප්‍රමාණය- මෙට්‍රික් ටොන් 10,618.76කි (ප්‍රගතිය - 68%කි).<br><br>ලබා දෙන ලද අරමුදල් - මහා භාණ්ඩාගාරය මගින් රුපියල් මිලියන 11,750 කි (ප්‍රගතිය- 100%කි).<br><br>**ඔඩපණ ණය යෝජනා ක්‍රමය**<br><br>ලබා දී ඇති මුළු ණය ප්‍රමාණය - 30 කි.<br><br>ණය මුදල්වල මුළු වටිනාකම - රුපියල් මිලියන 585කි.<br><br>ගෙවූ මුළු පොලී සහනාධාර මුදල - රුපියල් මිලියන 1.12කි. |
| **අරමුණ 04**<br><br>පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථාව සැලසීම. | 4.2 වසර 2030 වන විට සියලුම ගැහැණු ළමුන්ට සහ පිරිමි ළමුන්ට ගුණාත්මක වශයෙන් ඉහළ පූර්ව ළමාවිය සංවර්ධනයට, සත්කාර සේවාවන්ට සහ පූර්ව ප්‍රාථමික අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අවස්ථාව පැවතීම හා එමඟින් ඔවුන් ප්‍රාථමික අධ්‍යාපනයට සූදානම්ව සිටින බව තහවුරු කිරීම. | 4.2.1 ස්ත්‍රී පුරුෂ භාවය අනුව සෞඛ්‍යමය, ඉගෙනුම් සහ මනෝවිද්‍යාත්මක අංශයන්ගෙන් යහපත් සංවර්ධන මාර්ගයකට අවතීර්ණව සිටින වයස අවු. 5 ට අඩු ළමුන්ගේ ප්‍රමාණය | **"සිහිනි පාසල" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 62<br><br>ණය මුදල : රු. මිලියන 63.4<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 0.97<br><br>**"රැකවරන" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 9<br><br>ණය මුදල : රු. මිලියන 44.4<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 1.0 |
| | 4.7 වසර 2030 වන විට ඉගෙනුම ලබන සියලුම දෙනා තිරසර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ දැනුම සහ කුසලතාවන් ලබාගෙන සිටීම, එයට තිරසර සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය සහ තිරිසර ජීවන රටාවන්, මානව අයිතිවාසිකම්, සාමය සහ ප්‍රචණ්ඩත්වයෙන් තොර | 4.7.1 ගෝලීය පුරවැසිභාවය පිළිබඳ ඉගෙනුම ෂෂ. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සහ මානව හිමිකම් (අ) ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් (ආ) විෂය මාලාවන් (ඇ) ගුරු අධ්‍යාපනය සහ (ඈ) ශිෂ්‍ය ඇගයීම් යන සියළු මට්ටම්වල දී | **"මගේ අනාගතය" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 729<br><br>ණය මුදල : රු. මිලියන 650.5<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 59.84<br><br>**"ඇරඹුම" ණය යෝජනා ක්‍රමය** |

| | | | |
|---|---|---|---|
| | සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, ගෝලීය පුරවැසිභාවය සහ සංස්කෘතික විවිධත්වය ඇගයීම සහ තිරසර සංවර්ධනයට සංස්කෘතිකමය වශයෙන් දායක වීම ඇතුලත් වේ. | ප්‍රවාහානුගතව පැවතීම ඇතුළත් තිරසර සංවර්ධනය සඳහා වන ඉගෙනුම. | ණය සංඛ්‍යාව : 175<br><br>ණය මුදල : රු. මිලියන 230.99<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 9.33 |
| **අරමුණ 5**<br><br>ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම. | 5.1 කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලු ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම. | 5.1.1 ස්ත්‍රී පුරුෂ භාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම් ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවත්නේද නැද්ද යන්න. | **කාන්තා ව්‍යවසායකත්ව මූල්‍ය ආධාර ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 610<br><br>ණය මුදල : රු. මිලියන 597 |
| **අරමුණ 7**<br><br>සියල්ලන් සඳහා දැරිය හැකි, විශ්වසනීය, තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම. | 7. ආ) වසර 2030 වන විට විශේෂයෙන්ම අවම වශයෙන් සංවර්ධනය වූ රටවල කුඩා දිවයින් රාජ්‍යයන්හි සහ අනෙකුත් රටවල දේශ සීමාවන්ගෙන් ආවරණය වූ සංවර්ධනය වෙමින් පවත්නා රටවල් ද ඇතුලත්ව සියලුම සංවර්ධනය වන රටවල ඔවුන්ගේ වැඩසටහන් සැලසුම් වලට අනුකූලව නවීන සහ තිරසර බලශක්ති සේවා සැපයීම සඳහා යටතල පහසුකම් ව්‍යාප්ත කිරීම සහ තාක්ෂණය වැඩි දියුණු කරීම. | 7. ආ 1) දළ දේශීය නිෂ්පාදනයේ සහ තිරසර සංවර්ධන සේවා සඳහා වන යටිතල පහසුකම් සහ තාක්ෂණය පිණිස වන මූල්‍ය හුවමාරුව පිණිස වන සෘජු විදේශ ආයෝජන ප්‍රමාණයට අනුපාතව බලශක්ති කාර්යක්ෂමතාවය සඳහා වන ආයෝජන. | **"රිවි බල සවිය" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 453<br><br>ණය මුදල : රු. මිලියන 157.6<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 3.72 |
| **අරමුණ 8**<br><br>සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම. | 8.3) ඵලදායී ක්‍රියාකාරකම්වලට, සුනිසි රැකියා අවස්ථාවන්ට, ව්‍යවසායකත්වයට සහ නිර්මාණශීලී භාවයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්තියෙන් ප්‍රවර්ධනය කිරීම මූල්‍ය සේවාවන්ට ප්‍රවේශවීමට අවස්ථාව | 8.3.1) ස්ත්‍රී පුරුෂ භාවය අනුව, කෘෂිකාර්මික නොවන සේවා නියුක්තියේ නොවිධිමත් සේවා නියුක්ති ප්‍රමාණය. | **සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 1330<br><br>ණය මුදල : රු. මිලියන 12,478<br><br>**කුඩා තේ වතු හිමියන් සඳහා වන ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව 1520 |

| | | | |
|---|---|---|---|
| | සලසමින් ක්ෂුද්‍ර, කුඩා පරිමාණ සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් පිහිටුවීම් සහ සංවර්ධනය කිරීම් දිරි ගැන්වීම. | | ණය මුදල රු. මිලියන 2,385<br><br>**"ජය ඉසුර" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 1,000<br><br>ණය මුදල : රු. මිලියන 21,357.4<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 465.98<br><br>**"හරිත ණය" යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 242<br><br>ණය මුදල : රු. මිලියන 791.5<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 32.03<br><br>**"දිරි සවිය" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 572<br><br>ණය මුදල : රු. මිලියන 413.3<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 9.3<br><br>**"රිය ශක්ති" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 178<br><br>ණය මුදල : රු. මිලියන 613.8<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 39.44<br><br>**"මාධ්‍ය අරුණ" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 258<br><br>ණය මුදල : රු. මිලියන 76.9<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 0.07<br><br>**"සංචාරක පොඩ්ඩෝ" ණය යෝජනා ක්‍රමය** |

| | | | |
|---|---|---|---|
| | | | ණය සංඛ්‍යාව : 1,198<br><br>ණය මුදල : රු. මිලියන 538.46<br><br>2022 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 2.63<br><br>**"සිටි රයිඩ්" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 8<br><br>ණය මුදල : රු. මිලියන 52.1<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් නිකුත් කළ භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම : රු. මිලියන 1.2 |
| **අරමුණ 11**<br><br>නගර සහ ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත, සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම | 11.1) 2030 වන විට සියලුම දෙනාට ප්‍රමාණවත් ආරක්ෂාකාරී සහ අඩු මිලට ලබා ගත හැකි නිවාස සහ මූලික සේවාවන් වෙත ප්‍රවේශය තහවුරු කිරීම සහ පැල්පත් නිවාස වැඩි දියුණු කිරීම. | 11.1.1) පැල්පත්, අවිධිමත් ජනාවාස හෝ ප්‍රමාණවත් නොවන නිවාස පහසුකම් යටතේ ජීවත් වන නාගරික ජනගහනයේ ප්‍රමාණය. | **"සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 14,834<br><br>ණය මුදල රු. මිලියන : 2,958.3<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 79.72<br><br>**"හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය :**<br><br>ණය සංඛ්‍යාව: 1,282<br><br>ණය මුදල රු. මිලියන : 4,585.2<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල රු. මිලියන 322.84<br><br>**"සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය**<br><br>ණය සංඛ්‍යාව : 247<br><br>ණය මුදල රු. මිලියන : 1,332.5<br><br>2023 වසරේ ගෙවන ලද පොලී සහනාධාර වෙනුවෙන් බැංකු වෙත ගෙවන ලද මුදල : රු. මිලියන 84.12 |

**5.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය**

2016 වසරේ දී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට ආයෝජන ණය ලබා දීම සඳහා ඇ.ඩො. මිලියන 175 ක් වටිනාකමකින් යුත් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කළ අතර, 2020 වසරේදී විශේෂයෙන්ම, කොවිඩ් -19 වසංගතය හේතුවෙන් බලපෑමට ලක්වූ ක්ෂුද්‍ර,

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට සහාය වීම සඳහා  ආසියානු සංවර්ධන බැංකුව විසින් තවදුරටත් ඇ.ඩො.මිලියන 165 ක් ලබා දෙන ලදී.  ඊට අමතරව, 2022 වසරේ සිට පැවති ආර්ථික පසුබෑම හේතුවෙන් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාරික කටයුතු කෙරෙහි ඇති වූ අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින්, ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ණය සංරචකය සඳහා වෙන් කරන ලද ඇ.ඩො මිලියන 13.5 ක මුදලක් ආසියානු සංවර්ධන බැංකුවේ එකඟතාවය ඇතිව හදිසි ප්‍රතිචාර ණය සංරචකය ලෙස රජය විසින් ප්‍රතිඅරමුණු ගත කර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීම සිදු කරන ලදී . ආර්ථික පසුබෑමත් සමඟ ව්‍යාපාර බිඳවැටීමේ අවදානම අවම කිරීම හා රැකියා සුරක්ෂිත කිරීම සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ හදිසි මූල්‍ය අවශ්‍යතා ඉහළ ගිය අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් පුනර්ජීවනය සඳහා, 2022 ඔක්තෝම්බර් මස ඇ.ඩො මිලියන 13.5 ක් ඔවුන් සඳහා කාරක ප්‍රාග්ධන ණය ලෙස ලබා දෙන ලදී.

2023 වර්ෂය තුළ සංවර්ධන හවුල්කරුවන් වෙතින් නව මූල්‍ය සහාය පහසුකම් රජයට ලබා ගැනීමට නොහැකි වුවද, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා තවදුරටත් මූල්‍ය සහාය ලබා ගැනීම සඳහා වන සාකච්ඡා මහා භාණ්ඩාගාරය විසින් ඔවුන් සමඟ අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ මූල්‍ය ප්‍රවේශ හැකියාව ඉහළ නැංවීම සඳහා ඇ.ඩො. මිලියන 100ක් ලබා දෙමින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වැඩිදියුණු කිරීමේ මූල්‍ය ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට සහාය වීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී ඇත. එයින්, බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ ව්‍යාපාර නැවත නඟා සිටු වීම සඳහා කාරක ප්‍රාග්ධන ණය ලබා දීමට ඇ.ඩො. මිලියන 50 ක් සහ ඉතිරි ඇ.ඩො. මිලියන 50ල  බැංකු විසින් ඉල්ලා සිටින සුදුසු ඇපකර සැපයීමට නොහැකි සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් සඳහා ණය ඇපකර පහසුකම් සැපයීමට පොදු සීමිත සමාගමක් ලෙස ස්ථාපිත කර ඇති ජාතික ණය සුරැකුම් ආයතනයේ (National Credit Guarantee Institution) කොටස් ප්‍රාග්ධනය සඳහා රජයේ දායකත්වය ලෙස ලබා දෙනු ලැබේ. නව ව්‍යාපෘතියේ ණය ගිවිසුම 2024 මාර්තු මාසයේදී අත්සන් කිරීමට නියමිත වේ.

### 5.2.3 ආහාර සුරක්ෂිතතාව, පෝෂණය සහ තිරසාර කෘෂිකර්මය

මෙරට ආර්ථිකයේ දුෂ්කරතා පැවතියද, වී නිෂ්පාදනයේ පිරිවැය අවම කිරීම සඳහා වී ගොවීන්ට අඛණ්ඩව පොහොර සහනාධාරය ලබාදීමට රජය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණය කර ඇත. පවතින මූල්‍යමය සීමාවන් සැලකිල්ලට ගනිමින් පොහොර සඳහා වැයවන මුළු පිරිවැයෙන් 1/4 ක්, හනාධාර ලෙස ලබාදීමට රජය විසින් තීරණය කර ගොවීන්ට මූල්‍යමය ප්‍රදානයක් ලෙස පොහොර සහනාධාරය ලබා දෙන ලදි. ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය ආධාර ඇතිව 2022 වසරේ ආනයනය කරන ලද මියුරේට් ඔෆ් පොටෑෂ් (MOP) හි ඉතිරි තොග වෙළඳපල මිලට සමාන්තරව අලෙවි කරන ලද අතර එමඟින් පරිපූර්ණ බීජයක් ලබාගැනීමේ ක්‍රියාවලිය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වන මූලද්‍රව්‍යයක් වන පොටෑසියම් අඩංගු MOP භාවිතය මඟින් තහවුරු කෙරේ.  එම තීරණය රටේ ප්‍රධාන ආහාරය සඳහා පාරිභෝගිකයාට දැරිය හැකි මිලක් සහතික කිරීමට හේතු විය.

2023 වර්ෂයේ දී පොහොර සහනාධාර වැඩසටහන සඳහා වෙන් කළ මුළු මුදල රු. මිලියන 56,000 ක් වන අතර එයින් වසර තුළ රු. මිලියන 54,556 ක් වියදම් කර ඇති අතර එය 2022 වසරට සාපේක්ෂව 6.1% ක පමණ වර්ධනයකි.

2023 පොහොර සහනාධාර වැඩසටහන යටතේ සත්‍ය වියදම්

| අනු. අංකය | විස්තරය | එකතුව (රු.) |
|---|---|---|
| 1 | කාලීන ණය ආපසු ගෙවීම | 17,823,005,412 |
| 2 | වී වගාව සඳහා පොහොර සහනාධාර ගෙවීම (රසායනික පොහොර) | 2,598,394,301 |
| 3 | වී වගාව සඳහා පොහොර සහනාධාර ගෙවීම (කාබනික පොහොර) | 17,590,952,071 |
| 4 | අනෙකුත් ක්ෂේත්‍ර භෝග සඳහා පොහොර සහනාධාර ගෙවීම (රසායනික පොහොර) | 4,256,009,296 |
| 5 | පරිහරණ වියදම් | 6,398,114,832.9 |
| 6 | ගොවීන් සඳහා මූල්‍ය සහනාධාරය (මුදල් ප්‍රදානය) | 5,889,727,311 |
| | **එකතුව** | **54,556,203,224** |

රටේ පැවති අයහපත් ආර්ථික අර්බුදකාරී තත්ත්වය සමග ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම මෙන්ම ජනතාවගේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම අභියෝගයක් විය. විශේෂයෙන් සමාජයේ අඩු ආදායම්ලාභී කණ්ඩායම් වලට ආහාර ලබා ගැනීමේ හැකියාව සහ පහසුවෙන් ආහාර සඳහා ප්‍රවේශ වීමේ හැකියාව පවත්වා ගැනීම අභියෝගයක් වූ බැවින් ඒ සඳහා 2022/2023 මහ කන්නයේ රජයේ වී මිලදී ගැනීමේ වැඩසටහන යටතේ ඔවුන්ට අතිරේක සහයක් ලෙස සහල් ලබා දී ඔවුන් ආරක්ෂා කිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන යටතේ, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් 454ක් විසින් දිස්ත්‍රික්ක 20කින් වී මෙට්‍රික් ටොන් 100,895ක ප්‍රමාණයක්, නාඩු වී කිලෝවක් රුපියල් 100 බැගින් මිලදී ගෙන, එක් පවුලකට සහල් කිලෝග්‍රෑම් 20 බැගින් 2023 මාර්තු සහ අප්‍රේල් මාසවල දිස්ත්‍රික්ක 25හි අඩු ආදායම්ලාභී පවුල් 2,739,505ක් සඳහා සහල් මෙට්‍රික් ටොන් 54,974ක් බෙදා දෙන ලදී. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් ගොවීන්ට, අඩු ආදායම්ලාභී පවුල්වලට මෙන්ම සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ට ද ප්‍රතිලාභ අත්කර දෙන ලදී.

තවද, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් ශක්තිමත් කිරීම මෙන්ම ගොවීන්ට ඔවුන්ගේ වී අස්වැන්න සඳහා සාධාරණ මිලක් සහතික කිරීමේ අරමුණු ඇතිව, 2023 යල කන්නයේ දී ගොවීන්ගෙන් වී මිලදී ගැනීම සඳහා රාජ්‍ය බැංකු හරහා සහනදායී පොලී අනුපාත යටතේ ඔඩපණ ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. මෙම ණය යෝජනාක්‍රමය යටතේ, සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන්ට මහජන බැංකුව සහ ලංකා බැංකුව යන බැංකු දෙක මගින් රුපියල් මිලියන 585ක් වටිනා ණය පහසුකම් ලබා දෙන ලදී. ගොවීන්ගෙන් සාධාරණ මිලකට වී මිලදී ගැනීමට සුළු හා මධ්‍ය පරිමාණ වී මෝල්හිමියන් දිරිමත් කිරීම සඳහා ක්‍රියාත්මක මෙම ණය යෝජනා ක්‍රමය යටතේ සළුදායී පොලී අනුපාතයෙන් වාර්ෂිකව සියයට 4ක පොලී අනුපාතයක් මහා භාණ්ඩාගාරය විසින් අදාළ බැංකු වෙත පොලී සහනාධාරයක් ලෙස ගෙවන ලදී . ඒ අනුව, වර්ෂය තුළ මහජන බැංකුවට සහ ලංකා බැංකුවට ගෙවා ඇති මුළු පොලී සහනාධාර මුදල රුපියල් 1,124,872.60ක් පමණ වේ.

අස්වැන්න නොමැති කාලය තුල ගොවීන්ගේ ධාන්‍ය සඳහා ඉහළ සාධාරණ මිලක් සහතික කිරීම උදෙසා ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථාන 05 ක මෙහෙයුම් කටයුතු තවදුරටත් පවත්වාගෙන යාම සිදුවේ. දළ වශයෙන් මෙට්‍රික් ටොන් 17,200ක ඒකාබද්ධ ගබඩා ධාරිතාවකින් යුත් මෙම ගබඩා පහ අනුරාධපුර, බුත්තල, මන්නාරම, කිලිනොච්චි සහ පොළොන්නරුව යන ප්‍රදේශවල ඉදිකර ඇත්තේ වී, බඩ ඉරිඟු, සෝයා බෝංචි, තල, උඳු, ගම්මිරිස්, රටකජු සහ අනෙකුත් ධාන්‍ය අස්වැන්න නෙළන කාලය තුළ ගබඩා කිරීම සඳහා ය. ගබඩා පහසුකම් වලට අමතරව, වියළීම, පිරිසිදු කිරීම සහ ධාන්‍යවල තත්ත්ව පරීක්ෂාව වැනි පුළුල් පරාසයක සහායක සේවාවන් සපයනු ලබයි.

මෙහිදී ගොවීන්ට තම අස්වනු තොග ඇපයක් ලෙස භාවිතා කරමින් ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ පහසුකම් යටතේ සහනදායී පොලී අනුපාතයකට ණය මුදල් ලබා ගැනීමේ හැකියාව පවතී.

2023 වර්ෂයේදී දී ධාන්‍ය මෙට්‍රික් ටොන් 3,874 ක් ගබඩා කර ඇත. එසේම මෙම ධාන්‍ය සුරැකුම් මධ්‍යස්ථානවල ස්ථාපිත සූර්ය පැනලවලින් රජයට ලැබෙන ආදායමද ඇතුළුව ගබඩා පහසුකම් සැපයීමෙන් රුපියල් මිලියන 25ක මුදලක් උපයා ඇති අතර, මෙහෙයුම් හා නඩත්තු වියදම සඳහා මිලියන 38ක මුදලක් වැය වී ඇත. ගුදම් කුවිතාන්සි මූල්‍යකරණ වැඩසටහන යටතේ ගොවීන් 374 දෙනෙකු විසින් සහනදායී පොලී අනුපාත යටතේ රුපියල් මිලියන 151ක මුදලක් ලබා ගෙන ඇත.

## 06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

### 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය.

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු/(අතිරික්ත) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 23 | 18 | 05 |
| තෘතීයික | 01 | 01 | 00 |
| ද්විතීයික | 23 | 21 | 02 |
| ප්‍රාථමික | 12 | 09 | 03 |

### 6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

ඇබෑර්තු පවතින තනතුරෙහි රාජකාරි ආවරණ කටයුතු අනෙකුත් නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

### 6.3 මානව සම්පත් සංවර්ධනය

#### 6.3.1 දේශීය පුහුණුව

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සිමාව | සමස්ත ආයෝජනය (රු) | | වැඩසටහනේ ස්වභාවය ( දේශීය / විදේශීය) | නිමැවුම /ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| විද්‍යුත් ප්‍රසම්පාදන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (මාර්ගගතව) | 01 | දින 01 | 7,750 | -- | දේශීය | e-GP web portal ක්‍රියා පටිපාටිය හරහා වෙළඳපල මිල සැසඳුම් ප්‍රසම්පාදන ඇතුළුව විද්‍යුත් ප්‍රසම්පාදන පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| සංවර්ධන, පරිපාලනය සහ බලපෑම්කාරී වර්ධන ක්‍රම උපාය පිළිබඳ ආර්ථික විද්‍යා පුහුණු වැඩසටහන | 01 | දින 04 | -- | -- | දේශීය | උසස් ආර්ථික සංවර්ධනය සහ උපාය මාර්ග සංවර්ධනය සඳහා දැනුම ලබා ගන්නා ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ඉලෙක්ට්‍රොනික රජයේ ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 04 | දින 01 | -- | -- | දේශීය | විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය භාවිතා කිරීම පිළිබඳ දැනුම වැඩි දියුණු කර ඇත. |
| රියදුරන් සහ කාර්යාල කාර්ය සහයක සඳහා විනය සහ ආචාර විධි | 02 | දින 02 | 19,000 | -- | දේශීය | කාර්යාල කටයුතු කිරීම සඳහා ආචාර ධර්ම හා විනය සම්බන්ධව දැනුම ලබා ගන්නා ලදී. |
| නිවාඩු විෂය නිලධාරියාගේ රාජකාරි සහ වගකීම් | 01 | දින 01 | 5,000 | -- | දේශීය | නිවාඩු ලබා ගැනීම සම්බන්ධයෙන් නිලධාරීන්ගේ වගකීම් හා අයිතිවාසිකම්.පිළිබඳ දැනුම ලබා ගන්න ලදී. |
| ප්‍රවාහන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පාඨමාලාව | 02 | දින 20 | 120,000 | -- | දේශීය | ප්‍රවාහන කළමනාකරණය, නීතිරීති, රෙගුලාසි සහ යන්ත්‍රෝපකරණ හැසිරවීම පිළිබඳ දැනුම වැඩි දියුණු කර ඇත. |
| රජයේ නිලධාරීන්ගේ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය | 01 | දින 01 | 5,000 | -- | දේශීය | රාජ්‍ය සේවකයින් සඳහා වැටුප් පරිමාණයන් සහ වාර්ෂික වැටුප් වර්ධක සකස් කිරීමට දැනුම ගන්නා ලදී. |
| පුද්ගලික ලිපිගොනු ඵලදායී ලෙස නඩත්තු කිරීම | 01 | දින 01 | 5,000 | -- | දේශීය | පුද්ගලික ගොනුවක් විවෘත කිරීම සහ පුද්ගලික ගොනුවක් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් නීති රීති පිළිබඳව දැනුම ලබා ගන්නා ලදී. |
| නව CIGAS වැඩසටහන | 03 | දින 02 | -- | -- | දේශීය | දෙපාර්තමේන්තුවේ ගිණුම්කරණ ක්‍රියාවලිය සඳහා නව CIGAS භාවිතා කිරීම පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| සංවර්ධන, පරිපාලනය සහ බලපෑම්කාරී වර්ධන ක්‍රම උපාය පිළිබඳ ආර්ථික විද්‍යා පුහුණු වැඩසටහන | 02 | දින 04 | -- | -- | දේශීය | උසස් ආර්ථික සංවර්ධනය සහ උපාය මාර්ග සංවර්ධනය සඳහා දැනුම ලබා ගන්නා ලදී. |
| ICTO සඳහා සයිබර් ආරක්ෂණ ධාරිතා සංවර්ධනය | 01 | දින 01 | -- | -- | දේශීය | සයිබර් ආරක්ෂණ ධාරිතා සංවර්ධනය පිළිබඳ දැනුම ගන්නා ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| විනය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන | 01 | දින 02 | 9,500 | -- | දේශීය | නිලධාරීන්ගේ විනය පටිපාටිය සහ රාජකාරි වගකීම් පිළිබඳ දැනුම අවබෝධ කර ගන්නා ලදී. |
| රාජකාරි ලිපි සහ රාජකාරි සටහන් ලිවිම | 01 | දින 01 | 5,000 | -- | දේශීය | ලිපි ලිවීමේ කුසලතා සහ රාජකාරි සටහන් පත්‍ර සකස් කිරීම පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| වාර්ෂික ඉන්වෙන්ටරි සමීක්ෂණ වාර්තාව | 02 | දින 02 | 20,000 | -- | දේශීය | වාර්ෂික ඉන්වෙන්ටරි සමීක්ෂණ ක්‍රියාවලිය හඳුනා ගැනීම සහ සැකසීම පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| රජයේ ප්‍රසම්පාදන පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන | 03 | දින 02 | -- | -- | දේශීය | රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ දැනුම වැඩිදියුණු කර ගැනීමට සහ යාවත්කාලීන කර ගැනීමට හැකි විය |
| තාර්කික රාමු විශ්ලේෂණය | 03 | දින 06 | -- | -- | දේශීය | ප්‍රතිඵල මත පදනම් වූ සැලසුම්කරණය සහ තාර්කික රාමු විශ්ලේෂණ භාවිතය පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| ගුණාත්මක පරිසරයක් ඇති කිරීම සඳහා වෘත්තීය සංවර්ධන පුහුණුව | 09 | දින 02 | -- | -- | දේශීය | ගුණාත්මක පරිසරයක් සහ විනය ක්‍රියාපාටිය තුලින් කාර්යාලය තුල වැඩකිරීම සඳහා ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට හැකිවන ලදී |
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම | 01 | දින 01 | 6,000 | -- | දේශීය | කැබිනට් පත්‍රිකා සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම පිළිබඳ දැනුම ලබා ගන්නා ලදී. |
| දත්ත විශ්ලේෂණය සඳහා උසස් Microsoft Excel පුහුණුව | 02 | දින 03 | 36,000 | -- | දේශීය | කාර්යාලයේ එදිනෙදා රාජකාරී කටයුතු සඳහා Microsoft excel භාවිතා කිරීමට දැනුම වැඩි දියුණු කර ගන්නා ලදී |
| රජයේ නිලධාරීන්ගේ වැටුප් සැකසීම | 01 | දින 01 | 5,000 | -- | දේශීය | රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීමට දැනුම ලබා ගන්නා ලදී. |

6.3.2 විදේශ පුහුණුව

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු ) | | වැඩසටහනේ ස්වභාවය ( දේශීය / විදේශීය) | නිමැවුම /ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| සංවර්ධනය වෙමින් පවතින රටවල දිළිඳුකම පිටුදැකීම සඳහා තිරසාර සංවර්ධනය ට අදාල 2030 න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | සති 02 | | | විදේශීය | ආදායම් විෂමතාවය සහ කලාපීය විෂමතා අවම කිරීම සඳහා උපාය මාර්ග, ප්‍රතිපත්ති සහ වැඩසටහන් වැඩි දියුණු කිරීමට දැනුම ලබා ගන්නා ලදී. |
| ඩිජිටල් ආර්ථිකය සහ කර්මාන්ත ඒකාබද්ධ කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | සති 02 | | | විදේශීය | විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ දේශීය කර්මාන්ත සඳහා ඩිජිටල් ආර්ථිකය පිළිබඳ මූලික සංකල්පය යොදා ගැනීම පිළිබඳව දැනුම ලබා ගන්නා ලදී. |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසාය ධාරිතාව ගොඩනැගීම පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | දින 07 ක් පමණක් සහභාගී විය | | | විදේශීය | පෞද්ගලික කරුණක් හේතුවෙන් එම නිලධාරියාට නැවත ලංකාවට පැමිණීමට සිදු විය. |
| සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා බැංකුකරණය සහ මූල්‍ය කටයුතු | 01 | සති 02 | | | විදේශීය | බැංකු අංශය හරහා බැංකුවල කාර්යක්ෂමතාව/අකාර්යක්ෂමතාවයේ ගැටළු හඳුනා ගැනීමට සහ සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර එම අභියෝගවලට මුහුණ දීම සඳහා ක්‍රමානුකූල උපාය මාර්ග හඳුනා ගැනීමට හැකි විය. |
| ශ්‍රී ලංකාවේ කාර්මික උද්‍යානයේ ඉදිකිරීම් සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 01 | සති 02 | | | විදේශීය | නිදහස් වෙළඳ කලාප සැලසුම් කිරීම, ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳව මෙන්ම ඒවායේ තාක්ෂණික හා ආර්ථික සංවර්ධනය පිළිබඳ දැනුම ලබා ගැනීමට හැකි විය. |

## 07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම් | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1. | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාළ නොවේ | | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| 2. | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය ගණකාධිකාරීවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| **6.** | **අභ්‍යන්තර විගණන** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 6.4 | මු.රෙ. 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | කළමණාකරන විගණන චක්‍රලේඛ DMA/1-2019 අනුව, අවම වශයෙන් විගණන කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | අදාළ නොවේ | | |
| **8.** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ජේදය අනුව වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ජේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනයට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛනයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 9. | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අදාළ නොවේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් වන විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු, වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අදාළ නොවේ | | |
| 10. | **ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අදාළ නොවේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **11.** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම. | අනුකූල වේ | | |
| **12.** | **රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13.** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14.** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුලත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුම් ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15.** | **ආදායම් ගිණුම්** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම. | අනුකූල වේ | | |
| 15.2 | රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **16.** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත්කර තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **17.** | **මහජනයා වෙත තොරතුරු ලබාදීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනතාවගේ ප්‍රසංශා/චෝදනා පල කිරීමට පහසුකම් සලකා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **18.** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/20/18 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19.** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම. | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබිම. | අනුකූල වේ | | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20.** | **විගණන ජේදවලට ප්‍රතිචාර දක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ජේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |